# මාධ්‍ය නිවේදනය
**2024 මැයි 13**

## යුක්ති: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය තුළ වැඩ කරන ජනතාව සඳහා වේදිකාවක්

2024 මැයි 13 වන දින, පර්යේෂකයන්, ක්‍රියාකාරීන්, සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති සහ ප්‍රජා නායකයින් එක්ව යුක්ති නම් වේදිකාවක් දියත් කළහ. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යුක්තිය සඳහා වන වැඩකරන ජනතා ව්‍යාපාර සහ අරගල සඳහා සහාය දැක්වීමේ බහුවිධ සංසදයක් ලෙස "අහිමි කර දැමීමේ සිට සංවර්ධනය දක්වා: ශ්‍රී ලංකාවේ ණය යුක්තිය සඳහා වන ගමන් මග" යන මැයෙන් කොළඹ පැවති උත්සවයකදී YUKTHI දියත් කරන ලදී. ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය තුළ වැඩකරන ජනතාවගේ අත්දැකීම්, විවේචනාත්මක විශ්ලේෂණයන් මත පදනම්ව නව ලිබරල්වාදයට විකල්ප පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම මෙම සන්ධානයේ අරමුණයි.

ශ්‍රී ලංකාව දරාගත නොහැකි පෞද්ගලික සහ ද්විපාර්ශ්වික ණය ආපසු ගෙවීම (පොළිය සමඟ) 2027 දක්වා පමණක් කල් දමා ඇති, නුදුරු අනාගතයේ දීම නැවත වරක් සිය විදේශ ණය ගෙවීම පැහැර හැරීමට සිදුවනු ඇතැයි පුරෝකථනය කර ඇති තත්වයක් සහ ඒ නිසාම තවත් IMF කප්පාදු වැඩසටහනකට මග පැදෙනු ඇතැයි අනුමාන කළ හැකි තත්වයක් තුළ YUKTHI ශ්‍රී ලංකාව තුළ ණය යුක්තිය සඳහා පුළුල් ව්‍යාපාරයක් ගොඩනැගීමට උත්සාහ කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනේ සන්දර්භය තුළ ආන්ඩුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වර්තමාන සැලසුම් ශ්‍රී ලංකාවේ දේශපාලන ආර්ථිකයට ගැටළුවට ප්‍රතිකාරයක් නොවන බවත්; සහ වැඩකරන ජනතාවගේ ඉතිරිව ඇති වත්කම් සහ සම්පත් ස්වල්පය පාලක ප්‍රභූවරුන් වෙත යලි බෙදාහරින අතරම ඔවුන්ගේ සමාජ-ආර්ථික අයිතීන්ට පමණක් පහර දෙන බවත් යුක්ති තර්ක කරයි.

යාපනය විශ්ව විද්‍යාලයේ ආචාර්ය අහිලන් කදිරගාමර් සහ ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී සාමූහිකයේ (FCEJ) මධුලිකා ගුණවර්ධන ණය අර්බුදය සහ වැඩකරන ජනතාව කෙරෙහි එහි බලපෑම හෙළි කළහ. නීත්‍යානුකූල නොවන ණය අහෝසි කිරීම සඳහා වූ කමිටුවේ (CADTM) ආචාර්ය අමාලි වෙදගෙදර මහත්මිය පෞද්ගලික ණය හිමියන් සමඟ වත්මන් සාකච්ඡා ශ්‍රී ලංකාවට අහිතකර වන්නේ මන්දැයි සහ ශ්‍රී ලංකාවේ ණය පිළිබඳ මහජන විගණනයක වැදගත්කම පැහැදිලි කළාය. මෙම සැසිය සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ බාලසිංහම් ස්කන්ධකුමාර් විසින් මෙහෙයවන ලදී.

ණය අර්බුදය සහ ශ්‍රී ලංකා රජයේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාර වැඩකරන ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුමක් නොවන ආකාරය ක්‍රියාකාරීන් විසින් පැහැදිලි කරන ලදී. කයිට්ස් හි ධීවර නායක අන්නාලිංගම් අන්නාරාසා උතුරු පළාතේ කුඩා පරිමාණ ධීවරයින්ගේ නරක තත්ත්වය විස්තර කළේය. Colombo Urban Lab නිර්මාතෘ ඉරෝමි පෙරේරා සමාජ ආරක්ෂණයේ පසුබෑම සහ නාගරික වැඩකරන දුප්පතුන්ගේ ආතතිය අතර සම්බන්ධය පැහැදිලි කළාය. IMF පනවන ලද කොන්දේසිවලින් වතුකරයේ ප්‍රජාවන් පීඩාවට පත්වන ආකාරය පිළිබඳව තරුණ පර්යේෂකයන්ගේ ජාලයේ සාමාජිකා ආර්. බේබිශාලිනි ඉදිරිපත් කළාය. නීතිය සහ සමාජ භාරයේ විදුර ප්‍රභාත් මුණසිංහ වත්මන් ඉඩම් ප්‍රතිසංස්කරණ හරහා ඉඩම් සඳහා ප්‍රවේශය සීමා කිරීම ග්‍රාමීය දුප්පතුන්ගේ යහපැවැත්ම අඩපණ කරන්නේ කෙසේද යන්න පිළිබඳ පර්යේෂණ සොයාගැනීම් බෙදාහදා ගත්තේය. කුප්පි සාමූහිකයේ පේරාදෙණිය මහාචාර්ය ශාමල කුමාර් නිදහස් අධ්‍යාපනය සඳහා රාජ්‍ය වියදම් අඩු කිරීම සහ පෞද්ගලීකරණය ගැටලුවේ කොටසක් වන්නේ මන්දැයි විශ්ලේෂණය කළාය. නීතිඥ අර්මිසා ටීගල් නව නීතිවල දේශපාලන මර්දනය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට යටත් වීම බලාත්මක කිරීම සඳහා යෝජිත නීති ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ඉදිරිපත් කිරිමත් සමග සැසිය අවසාන විය. මෙම සැසිය Climate Action Now Sri Lanka හි මෙලනි ගුණතිලක සහ තරුණ පර්යේෂකයන්ගේ ජාලයේ යතුර්ෂා යුලකේන්ද්‍රන් විසින් මෙහෙයවන ලදී.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ ව්‍යුහාත්මක මූලයන් පිළිබඳ සම්පත් සහ අර්බුදයේ පිරිවැය එය නිර්මාණය කළ පාලක ප්‍රභූ පැලැන්තියට වඩා එහි වින්දිතයින් විසින් දරනු ලබන ආකාරය ලේඛනගත කරන ලද YUKTHI වෙබ් අඩවිය මෙම අවස්ථාව අතරතුර සජීවීව ක්‍රියාත්මක විය.

යුක්ති වෙබ් අඩවිය
www.yukthilk.org
yukthicollective@gmail.com
+94771888988
03,කින්සි ටෙරසය,කොළඹ 08000